# දෙවියන් වහන්සේ ගැන සිංහල බෞද්ධ විවරණයක්

මේ ලිපියෙන් මා බලාපොරොත්තු වන්නේ දෙවියන් වහන්සේ යනු කවුද හෝ කුමක් ද යන්න පිළිබඳ ව මගේ අර්ථකථනයන් කිරීමටය. එය කිසිසේත්ම එක් ආගමක් හෝ ආගම් කිහිපයක් විවේචනය කිරීම අරමුණු කරගත්තක් නොවේ. මෙය දෙවියන් වහන්සේ ගැන කරන එක් අර්ථකථනයක් පමණකි. තවත් අර්ථකථන රාශියක් ඇති බවත් අනාගතයේ දී තව තවත් අර්ථකථන ඇති වන බවත් මම දනිමි. මෙහි සඳහන් අර්ථකථනය මා කරන්නේ දැනුම පිළිබඳ දැනුම, එනම් ඥාන විභාගය (එපිස්ටමොලොජි) මුල් කරගෙනය. නිල වශයෙන් මගේ විෂය බටහිර ගණිතය හා බටහිර සෛද්ධාන්තික භෞතික විද්‍යාව වුව ද නිල නොවන වශයෙන් ඒ පෙරදිග ඥාන විභාගය වෙයි. මා මේ විවරණය කරන්නේ සිංහල බෞද්ධයකු ලෙසය. එනම් මේ විවරණය පිටුපස ඇත්තේ මා සිංහල බෞද්ධ සංස්කෘතියෙන් උකහාගත් දේය. එහෙත් එයින් කියැවෙන්නේ සෑම සිංහල බෞද්ධයකුම මේ අර්ථකථනය සමග එකඟ වන බව නොවේ. මේ අර්ථකථනය සමග වෙන කිසිම සිංහල බෞද්ධයකු එකඟ නොවුණ ද සිංහල බෞද්ධ සංස්කෘතිය මගින් ඒ නිර්මාණය වන බැවින් ඒ සිංහල බෞද්ධ විවරණයක් වෙයි.

දෙවියන් වහන්සේ ගැන පමණක් නොව නිවන ගැන ද විවිධ අර්ථකථන වෙයි. සිංහල බෞද්ධයන් අතර පවා නිවන ගැන විවිධ මතිමතාන්තර වෙයි. රිස් ඩේවිස් මැතිනිය වැනි ඇතැම් බෞද්ධයන්ට අනුව සියල්ල මේ භවයෙන් කෙළවර වෙයි. නාගර්ජුනපාදයන් වහන්සේට නිවන සංසාරයට සාපේක්ෂ වුවක් විය. මේ සියලු අර්ථකථන යනු දැනුම වෙයි. එහෙත් මගේ දැනුම අනුව නිවන යනු දැනුමක් නොවේ. නිවන පමණක් නොව අනිත්‍ය, දුක්ඛ, අනාත්ම හා දෙවියන් වහන්සේ ද දැනුම නොවේ. මේ සියල්ල පිළිබඳ මෙතරම් දැනුම ඇත්තේ ද ඒ දැනුම නොවන බැවින් යැයි මම සිතමි. දැනුමක් ලෙස මා සලකන්නේ අවසාන වශයෙන් ගත්කල මනසින් නිර්මාණය කෙරෙන ප්‍රවාදයක් සංකල්පයක් හැඟීමක් වැනි දෙයකටය.

නිවන, අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, දෙවියන් වහන්සේ ආදිය පිළිබඳ මෙතරම් ගැටලු ඇති වන්නේ අප ඒ මනසින් තේරුම් ගැනීමට උත්සාහ කරන බැවිනි. මේ එකක්වත් මනසින් තේරුම් ගත හැකි දේ යැයි මම නොසිතමි. එහෙත් එයින් කියැවෙන්නේ ඒ සියල්ල එකක් බව ද නොවේ. මනසින් තේරුම් ගත නොහැකි දෑ ගැන මනසින් තේරුම් ගැනීමට යෑමේ ප්‍රතිඵලය වී ඇත්තේ මනසින් තේරුම් ගත නොහැකි දෑ පිළිබඳ විවිධ අර්ථකථන බිහිවීමය. සංකල්ප නොවන දෑ පිළිබඳ (දෑ යනුවෙන් මෙහිදී යෙදුන ද මේවා දේවල් නොවේ. මේවා, දේවල් වැනි වචන යොදා ගැනීම නුසුදුසු වුවත් අපට කළ හැකි දෙයක් නැත. භාෂාව පමණක් නොව චිත්ත රූපද මොන තරම් දුර්වල දැයි මෙවැනි අවස්ථාවල අපට පසක් වෙයි. භාෂාව, චිත්ත රූප ආදිය මිනිසුන්ගේ නිර්මාණ වෙයි. ඒ නිර්මාණවල මිනිසුන්ගේ මෙන්ම අඩුලුහුඩුකම් වෙයි.) සංකල්ප නිර්මාණය කර ගැනීමට සිදුවීම අපට ඇති විශාලතම ගැටලුව වෙයි.

දෙවියන් වහන්සේ පිළිබඳ සංකල්පය කවදා නිර්මාණය කෙරිණිදැයි නිශ්චිතව කිව හැකි නොවේ. ලොවෙහි පහළ වූ ඉතාමත් ම වැදගත් (එසේ සංකල්පගත කිරීම වැරදි වුව ද) සංකල්පයක් වන්නේ ඒකදේවවාදයයි (මොනොතීසම්) පැරණි මිනිස්සු බහු දේවවාදීහු වූහ. ඒකදේවවාදය, බ්‍රාහ්මණ ආගම්, ක්‍රිස්තියානි හා කතෝලික ආගම් ඉස්ලාම් ආගම හා යුදෙව් ආගමට ද පොදු වෙයි. ඒ සංකල්පය පැරණි පර්සියාවෙහි (ඉරානයෙහි) පහළ වූ ශරතුස්ත්‍රවාදයෙහි ද වෙයි. පැරණි යුදෙව්වන් පිළිම වන්දනාව ද කළ බහුදේවවාදී වූ බවද ඔවුන් පසු කලෙක ඒකදේවවාදී වූ බව ද සඳහන් කළ යුතුය. ඇතැමුන්ට අනුව යුදෙව්වන් ඒකදේවවාදී වී ඇත්තේ පැරණි බැබිලෝනියාවෙහි දී ඔවුන්ට ශරතුස්ත්‍රවාදීන්ගේ ඒකදේවවාදී අදහස් ලැබීමෙන් පසුවය. කෙසේ වෙතත් ඒකදේවවාදය ඉතිහාසයෙහි යම් වකවානුවක, සමහර විට අවුරුදු හාරපන්දාහකට ඉහත දී මැද පෙරදිග, පර්සියාව, ආශ්‍රිත පෙදෙසක ඇතිවිණි යැයි සිතීමට ඉඩ තිබේ. ඇතැම් විට එය භාරතයේ ඇති වී පසුව පර්සියාවට හා මැද පෙරදිගට අපනයනය වුවා ද විය හැකිය. ඒකදේවවාදයෙහි සම්භවය කිනම් රටක සිදු වුව ද ඒ පිටුපස ඇත්තේ මනසට ගෝචර නොවන ලෝකය කුමක් ද යන ප්‍රශ්නය ය.

මේ ප්‍රශ්නය අද බටහිර සෛද්ධාන්තික භෞතික විද්‍යාවට ක්‍රමයෙන් ඇතුල් වෙමින් ඇත. ක්වොන්ටම් භෞතිකය තවත් වර්ධනය වීමෙන් පසුව බටහිර භෞතික විද්‍යාවට මෙය ප්‍රශ්නයක් වනු ඇත. මනසට ගෝචර නොවන

© Prof. Nalin De Silva

ලෝකයක් ගැන බටහිර දාර්ශනිකයන් ද කතා කර ඇත. කාන්ට් වැනි පඬුවන් පමණක් නොව අද ජීවත්වන ඩෙරිඩාලා වැනි විද්වත්තු ද මේ මනසට ගෝචර නොවන දේ ගැන විවිධ මත පළ කරති. එහෙත් මේ සියලු දෙනාට ම පෙර ඒ ගැන කතා කළෝ පැරණි ආසියාතික මැද පෙරදිග, පර්සියාව, භාරතය) දාර්ශනිකයෝ ය. ඔවුන්ට අපි ඇතැම් විට සෘෂීන් යැයි කියමු. එසේත් නැත්නම් අනාගත වක්තෘන් (ප්‍රොෆට්) යැයි කියමු. කිනම් නමකින් හැඳින් වුව ද ඔවුහු ඉතාම අමාරු ප්‍රශ්නයකට තම මනස් යොමු කළහ. ඔවුන්ගේ මනස් යොමු වුයේ මනසට ගෝචර නොවන ලෝකයක් ඇත් ද (මෙයට අපි නිරමානසික ලෝකය යැයි කියමු. මනසින් නිර්මාණය කෙරෙන ලෝක මානසික ලෝක වෙයි) ඇත්නම් ඒ කුමක් ද යන්නටය. මේ ප්‍රශ්නයට ඔවුන් දුන් පිළිතුරු වුයේ බ්‍රහ්මන්, දෙවියන් වහන්සේ, අල්ලා දෙවියන් වහන්සේ ආදිය ය. මේ නිර්මානසික ලෝකය ඒකත්වයෙන් (අද්වෛතව, දෙවැන්නක් හෝ දෙවැන්නක් නොමැතිව. සමස්තයක් ලෙස ආදී වශයෙන්) ගත් ඔවුහු ඒ සැම තැනම ඇත ආදී වශයෙන් හැර ඒ ගැන වෙනත් යමක් කීම ප්‍රතිකෙෂ්ප කළහ. දෙවියන් වහන්සේ හෝ බ්‍රහ්මන් හෝ අල්ලා දෙවියන් වහන්සේ යනු නිර්මානසික ලෝකයට දුන් විවිධ නම් වෙයි. නිර්මානසික ලෝකය ගැන යමක් කීම යනු මනසින් තනා ගන්නා සංකල්පවලින් එය පැහැදිළි කිරීමකි. එසේ මනසින් තනාගත් සංකල්පවලින් පැහැදිලි කිරීම යනු නිර්මානසික ලෝකය මානසික ලෝකයක් බවට පත් කිරීමකි. එය නොකළ යුත්තක් බව පැරණි දාර්ශනිකයන් වටහා ගන්නට ඇත. මෙහිදී සඳහන් කළ යුතු වැදගත් කරුණක් වෙයි. පැරණි දාර්ශනිකයෝ නිර්මානසික ලෝකයක් පවතින බවත්, එය අද භාවිතා කරන වචනයෙන් යොදා ගත්තොත් යථාර්ථය බවත්, යථාර්ථය (සාමාන්‍ය මනස ඉක්මවා යන තත්ත්වයකින්) අවබෝධ කරගත හැකි බවත් විශ්වාස කළහ.

නිර්මානසික ලෝකය ගැන අප දන්නේ කුමක් ද? අද්වෛත වේදාන්තය පරිසමාප්තියකටපත් කළ සංකරාචාරයයෝ නිර්මානසික ලෝකය නිර්ගුණ බ්‍රහ්මන් ලෙස හැඳින් වුහ. නිර්ගුණ බ්‍රහ්මන්ගේ ගුණයක් ප්‍රකාශ කළ නොහැකිය. එසේ ප්‍රකාශ කළහොත් එය මනසින් තනාගන්නා සංකල්පයකින් කෙරෙන බැවින් ඒ මානසික ලෝකයකට අයත් වෙයි. නිරගුණ බ්‍රහ්මන යන සංකල්පයක් නොවේ. වෙන කළ හැකි කිසිවක් නොමැති බැවින් වචනයක් යොදා ගත්ත ද ඒ වචනය අනිත්‍ය දුක්ඛ අනාත්ම මෙනි. (අනිතය යනු අ - නිත්‍ය හෝ වෙනස්වීම යන සංකල්පය නොවේ. වැඩි විස්තර සඳහා මගේ ලෝකය තුන්වැනි මුද්‍රණය කියවන්න) නිර්ගුණ බ්‍රහ්මන් මනසට ගෝචර නොවේ. මේ පිළිබඳ ව සංග්වේදයෙහි කියැවෙන්නේ ද බ්‍රහ්මණ්ට ස්වරූපයක් නැතැයි යනුවෙනි. ඇතැම් තැනක බ්‍රහ්මන් ස්වරූපයක් (ආකාරයක්) ඇති මෙන් ම නැති ලෙස දැක් වෙයි. ඒ බ්‍රහ්මන් ම ලෝකය (මානසික) වූ පසු ඇති වන තත්ත්වයද සැලකිල්ලට ගෙන යෙදුවක් විය හැකි ය. නාසදීය සූත්‍රයෙහි දැක්වෙන අන්දමට ආරම්භයෙහි දී සියල්ල අඳාන විය. එය වතුරෙන් පිරී තිබුණි. සියල්ල අවිද්‍යමානයෙන් වැසී තිබුණි. එය විද්‍යමාන වුයේ භාවනාවෙනි. භගවත් පුරාණයෙහි දැක්වෙන ආකාරයට නිර්මාණයට පෙර බ්‍රහ්මන් පමණක් ම විය. බ්‍රහ්මන් මනසට හෝ ඇසට හෝ වෙනත් ඉන්ද්‍රියකට ගෝචර නොවීය.

දෙවියන් වහන්සේ ගැන....

බ්‍රහ්මන්ට ඔහුගේ ආශාවන්ට අනුව දැකීමට අවශ්‍ය වූ විට දැකිය නොහැකි විය. එවිට බ්‍රහ්මන් මා විවිධ ස්වරූප ගනිත්වා යන පැතුම සමග මායා නම් ආලෝකය මැවී ය. මේ මායාව අනුව ලෝකය විද්‍යමාන විය. පසු කලෙක එක් වූ ශිව නර්තනය නම් සංකල්පය අනුව ලෝකය විවිධ ස්වරූප ගැනීම ශිවගේ නැටුමෙහි ප්‍රතිඵලයකි. නැටුමෙහි විවිධ වේශ වෙයි. නැටුම නොවන්නට විද්‍යමාන වූ ලෝකයක් නැත. බ්‍රාහ්මණ ආගම් අනුව අප සංසාරයේ සැරිසරන්නේ මායාව හේතුකොටගෙන ය. මායාව නිසා අපට අප බ්‍රහ්මන්ගෙන් වෙන් වුවා සේ දැනෙයි. (අද්වෛත වෙදාන්තය අනුව බ්‍රහ්මන්ගෙන් වෙන් විය යන්න ද වැරදි සංකල්පයකි. ඇත්තේ බ්‍රහ්මන් පමණක් බැවින් බ්‍රහ්මන්ගෙන් වෙන් විය නොහැකිය.) බ්‍රහ්මන් සමග එකතු වී විමුක්තිය ලබාගත හැක්කේ මායාව දුරලීමෙනි. ඒ සඳහා සාමාන්‍ය මනස ඉක්ම වූ යෝග (යෝග යනු එකතු වීමය) භාවනා කළ යුතු වෙයි.

© Prof. Nalin De Silva

බ්‍රහ්මන්, නිර්මාණය හා විමුක්තිය සම්බන්ධයෙන් විවිධ කාලවල නිර්මාණය වූ ඉහත දක්වා ඇති හා දක්වා නොමැති අදහස්වලින් අපට එළඹීමට හැකි නිගමනයක් වෙයි. මායාව, එය ආලෝකය ලෙස හැඳින් වුව ද සංසාරයේ අප දක්කාගෙන යන හේතුව ලෙස ගත්තද, ශිව නර්තනය පිළිබඳ අදහස ගත්ත ද කියැවෙන්නේ මනසට, ඇසට හා අනෙක් ඉන්ද්‍රිවලට ගෝචර නොවූ අවිද්‍යමාන (අන්මැනිෆෙස්ටඩ්) ලෝකයක් ඇති බවත් ඒ ලෝකය විද්‍යමාන (මැනිෆෙස්ට්) වන්නේ මායාව හෝ නර්තනය හෝ වෙනත් එවැන්නක් නිසා බවත් ය. විද්‍යමාන ලෝකය මැවෙන්නේ අවිද්‍යමාන ලෝකයෙනි. එවිට අවිද්‍යාමාන ලෝකයට, එනම් මනසට ගෝචර නොවන ලෝකයට, එනම් නිර්මානසික ලෝකයට, මවන්නා හෙවත් ප්‍රාණවාචී බ්‍රහ්මන් යන්න ආරෝපණය කිරීමේ අපහසුවක් නැත. මා තේරුම් ගන්නා ආකාරයෙන් බ්‍රහ්මන් යන එසේ ප්‍රාණවාචී සංකල්පයක් බවට පත් කරනු ලැබූ නිර්මානසික ලෝකයයි. මේ නිර්මානසික ලෝකය හෙවත් (මානසික) අඥානභාවය යථාර්ථය වන අතර මානසික ව නිර්මාණය කර ගන්නා දැනුම අපේ ඉන්ද්‍රිය (මනස ද ඉන්ද්‍රියන් වෙයි) ගෝචර ලෝකය වෙයි.

යුදෙව් හා ක්‍රිස්තියානි දෙවියන් වහන්සේ හා අල්ලා දෙවියන් වහන්සේ පිළිබඳ අදහස් ද යම් යම් වෙනස්කම් තිබුණ ද මූලික වශයෙන් ගත් කල ඉහත සඳහන් කරුණුවලින් වෙනස් නොවේ. යුදෙව්වන්ගේ යෙහෝවා දෙවියන් වහන්සේ මෙන් ම අල්ලා දෙවියන් වහන්සේ ද රූපකායකින් තොරය. මිනිසා මවා ඇත්තේ දෙවියන් වහන්සේ ස්වරූපයෙන් යැයි පරණ තෙස්තමේන්තුවේ සඳහන් වුව ද දෙවියන් වහන්සේට මිනිසකුගේ භෞතික ස්වරූපය ඇතැයි ඉන් නොකියැ වෙයි. මේ දෙවියන් වහන්සේ පිළිබඳ චිත්ත රූපයක් හෝ මවාගත නොහැකිය. යුදෙව් ආගමේ මෙන්ම ඉස්ලාම් ආගමේ ද විවිධ ක්‍රිස්තියානි ආගම්වලද දෙවියන් වහන්සේගේ පිළිම ඇඹීමක් හෝ රූප චිත්‍රගත කිරීමක් හෝ නෙකෙරෙයි. මෙයින් අදහස් වන්නේ දෙවියන් වහන්සේ මනසින් සිතා ගත නොහැකි ය යන්න ය. වෙනත් වචනවලින් කියන්නේ නම් දෙවියන් වහන්සේ මනසට ගෝචර නොවෙයි.

පරණ තෙස්තමේන්තුවේ උත්පත්ති කතාවෙහි සඳහන් අන්දමට ආදම් හා ඒව මැවීමෙන් පසුව දෙවියන් වහන්සේ ඔවුන්ට එක් ගසක ගෙඩි කෑම තහනම් කළහ. පසුව සර්පයාගේ මෙහෙයවීමෙන් ඒව ද ඒවගේ කැමැත්තට ඉඩදී ආදම් ද තහනම් ගසේ ගෙඩි කෑහ. මෙය පවෙහි ආරම්භය ලෙස පරණ තෙස්තමේන්තුවෙහි ඉගැන් වෙයි. මේ පව කුමක්ද? තහනම් ගහේ කතාවෙහි යම් යම් පරස්පර ඇතැයි කිසිවකු කිව ද මෙහි හරය වශයෙන් කියැවෙන්නේ තහනම් ගහේ ගෙඩි කෑමෙන් පසුව ආදම් හා ඒවට මානසික ලෝකය විවෘත වූ බවය. ඔවුන් තමන් නග්න ව සිටි බව දැන ගත්තේ ඉන් පසුව ය. ඔවුන්ට ලැජ්ජාව නම් හැඟීම ඇතිවන්නේ ඉන් පසුව ය. මා තේරුම් ගන්නා ආකාරයට එතෙක් නිර්මානසික ලෝකය පමණක් දැන සිටි ආදම් හා ඒව තහනම් ගහේ ගෙඩි කෑමෙන් පසුව මානසික ලෝකය, එනම් දැනුම, නිර්මාණය කිරීමට පටන් ගත්හ. මානසික ලෝකය නිර්මාණය වන්නේ නිර්මානසික ලෝකයෙනි. ඒ නිර්මානසික ලෝකය දෙවියන් වහන්සේය. දෙවියන් වහන්සේ සමග පාරාදීසයේ සිටි ආදම් හා ඒව තහනම් ගහේ ගෙඩි කා පව්, එනම් දැනුම, රැස්කර ගත්හ. බ්‍රාහ්මණ ආගම්වල මායාව නිසා බ්‍රහ්මන්ගෙන් වෙන් වූ දැනුමක් ලබා සංසාරයේ සැරිසැරීම සහ ආදම් හා ඒව තහනම් ගහේ ගෙඩි කා දැනුම ලබා ගැනීම හෙවත් පව් කිරීම අතර ඇත්තේ සමීප සම්බන්ධයකි. ක්‍රිස්තියානි ආගම් අනුව විමුක්තිය ලබා ගැනීම සඳහා පව් සමා කර සාමාන්‍ය මනස ඉක්ම වූ ආකාරයකට දෙවියන් වහන්සේ ගැන විශ්වාසයක් තබා කටයුතු කළ යුතුය. මේ විශ්වාසය බුද්ධියෙන් ලබාගත හැක්කක් නොවේ. ඉස්ලාම් ආගමෙහි පව් සම්බන්ධයෙන් තරමක වෙනසක් වෙයි. ආදම් හා ඒව තහනම් ගහේ ගෙඩි කෑම පවක් ලෙස ඉස්ලාම් ආගම උගන්වයි. කෝරානයට අනුව ඔවුන් තහනම් ගහේ ගෙඩි කන්නේ අල්ලා දෙවියන් වහන්සේගේ කැමැත්ත පරිදිය. එහි පව වන්නේ අල්ලා දෙවියන් වහන්සේට විරුද්ධ වීම ය.

මේ සියල්ලෙන් පැහැදිළි වන්නේ මනසින් ග්‍රහණය කර ගත නොහැකි නිර්මානසික ලෝකයක පැවැත්ම පිළිගැනීම, එය යථාර්ථය ලෙස සැලකීම, මානසික ලෝක නිර්මානසික ලෝකයේ නිර්මාණයක් හෝ එහි විවිධ විද්‍යමාන ස්වරූප ලෙස සැලකීම, නිර්මානසික ලෝකයෙන් වෙන් වී මානසික ලෝක නිර්මාණය කිරීම නිසා පව හා ඇතැම් ආගමික සංසාරය ඇති වන බව පිළිගැනීම. එසේ නොවුවත් නිර්මානසික ලෝකයට විරුද්ධවීම පවක් ලෙස සැලකීම ආදී කරුණු ඒකදේවවාදී ආගම්වල ඇති බවය. පැරණි දාර්ශනිකයන් මනසින් ග්‍රහණය කර ගත නොහැකි ලෝකයක් ගැන කල්පනා කිරීම ම ඉතා වැදගත් කරුණකි. තාර්ථය ලෙස ගත් ඒ ලෝකයෙන් මානසික ලෝක නිර්මාණය වන බව විද්‍යමාන වන බව තේරුම් ගැනීමෙන් පසු ඒ නිර්මානසික ලෝකයට ප්‍රාණවාචී නිර්මාපකයා යන අදහස ආරෝපණය වන්නට ඇතැයි සිතිය හැකිය. විශේෂයෙන් ම සාමාන්‍ය ජනයාට අප්‍රාණවාචී නිර්මානසික ලෝකයකට වඩා ප්‍රාණවාචී

© Prof. Nalin De Silva

නිර්මාපකයකු තේරුම් ගැනීම පහසුය. ථෙරවාදී බෞද්ධයන් මේ සියල්ලෙන් වෙනස් වන්නේ නිර්මානසික ලෝකය ද යථාර්ථයක ලෙස නොපිළිගැනීමෙන් හා ඒ තේරුම් ගත හැක්කේ සාමාන්‍ය මනස ඉක්ම වූ තත්ත්වයකින් නොව අනිත්‍ය දුක්ඛ අනාත්ම අවබෝධයෙන් හා මනස ද නිර්මාණයක් බව නැති මනසින් අවබෝධ කර ගැනීමෙන් ය යනුවෙන් පිළිගැනීමෙනි. ථෙරවාදී බෞද්ධයන්ට අනුව සංස්කාර ඇති වන්නේ එනම් මානසික ලෝක නිර්මාණය වන්නේ අවිද්‍යාව, එනම් අනිත්‍ය, දුක්ඛ අනාත්ම පිළිබඳ අවිද්‍යාව හේතුකොට ගෙනය.

මහාචාර්ය නලින් ද සිල්වා

© Prof. Nalin De Silva